25.05.09

Learning Resource Center
R
De Mazenod College
Kandana

# ද මැසිනොද් විදුහල - කඳාන

## 1 වාර පරීක්ෂණය -2025

## පුරවැසි අධ්‍යාපනය

07 ශ්‍රේණිය | කාලය: පැය 2යි

## I කොටස

- අංක 01 සිට 05 දක්වා ප්‍රශ්න වලට පිළිතුරු වරහන් තුළින් තෝරා ලියන්න.

(01) ඕනෑම පුද්ගලයෙකු උපතත් සමග මුලින්ම සාමාජිකත්වය ලබන සමාජ ඒකකය වන්නේ, .........................යි. ( පාසල/ පවුල/ ආගමික ස්ථාන )

(02) ......................... පවුලක සාමාජික සංඛ්‍යාව වැඩි නිසා පවුලේ ශක්තිය වැඩිය. ( න්‍යෂ්ටික / විස්තෘත/ පුංචි පවුල)

(03) ඔබගේ උසස් ගතිගුණ, උසස් හැසිරීම් රටා, සුවිශේෂී හැකියාවන් පිළිබඳ ඇතිකරගන්නා සිතුවිල්ල .........................යි. ( ආත්මාභිමානයයි/ ආත්ම විශ්වාසයයි / ආත්ම ශක්තිය )

(04) ජන සමාජයේ පවත්නා අහිතකර බලවේගයකි ...................... ( හොඳ පොත්පත් / කළණ මිතුරන් / නරක මිතුරන් )

(05) පවුල් ඒකකය ස්ථාවර වීම, ..................... ගුණවත්වීම ජන සමාජයක පැවැත්මටද හේතුවේ. ( ශක්තිමත් වීම / ධෛර්‍ය යමත්වීම / ලස්සන වීම )

- අංක 06 සිට 10දක්වා දී ඇති වාක්‍ය නිවැරදි නම් (✓) ලකුණද වැරදි නම් ( X ) ලකුණද ඉදිරියේ ඇති හිස්තැන තුළ යොදන්න.

(06) ජන සමාජයේ කුඩාම සමාජ ඒකකය වන්නේ පවුලයි ( )

(07) පවුල ඥාතීත්වය මත ගොඩනැගී ඇත ( )

(08) වඩාත් උචිත අරමුණු තෝරා ගැනීම මගින් ජීවිතය සාර්ථක කර ගැනීමට නොහැකි වේ ( )

(09) ජන සමාජයේ ඇති හිතකර බලපෑමකි, හොඳ මාධ්‍ය වැඩසටහන් ( )

(10) ඔබට ලැබෙන විවේක කාලය ඵලදායි ලෙස ගත කිරීමට හුරු පුරුදු වීම ඔබේ අයහපතට හේතු වේ ( )

- අංක 11 සිට 15 දක්වා ප්‍රශ්න වලට පිළිතුරු වරහන් තුළින් තෝරා ලියන්න.

(11) වර්තමානයේ පුද්ගලයෙකු සුවිශේෂීව හඳුනා ගැනීම සඳහා භාවිතා කරනු ලබන්නේ ............................. ව්‍යුහය පිළිබඳ පරීක්ෂණයයි.

(12) සමාජයේ යහපතට හේතු වන ආයතනයකි ..............................

(13) සිත තුළ ජනිත වන සිතුවිලි ............................. ලෙස හඳුන්වයි.

(14) ............................ සන්නිවේදනය හා ප්‍රවාහනය ආදී සේවාවන් අපේ අවශ්‍යතා ඉටු කර ගැනීමට ප්‍රයෝජනවත්ය.

(15) පවුලෙන් ඔබට ලැබෙන අයිතිවාසිකමකි. ..............................

( අධ්‍යාපනය ලබා දීම / අමාත්‍යාංශ ව්‍යාපාරය/ සෞඛ්‍යය/ චිත්තවේග/ DNA )

- අංක 16 සිට 20 දක්වා ප්‍රශ්න වලට නිවැරදි පිලිතුර තෝරා යටින් ඉරක් අදින්න.

(16) ඇසුරුම් සහිත නිෂ්පාදනවල මුද්‍රණය කර ඇති වැදගත් විස්තරයක් නොවන්නේ,
1. නිෂ්පාදිත දිනය
2. කල් ඉකුත් වීමේ දිනය
3. උපරිම සිල්ලර මිල
4. නිශ්පාදන ක්‍රියාවලිය

(17) අයහපත් චිත්තවේග තත්වයකි.
1. සතුට
2. කෝපය
3. කරුණාව
4. දයාව

(18) ක්‍රීඩාවල යෙදීමෙන් පුද්ගලයෙකු තුල වර් ධනය වන ගුණාංගයක් නොවන්නේ,
1. නීතිගරුක වීම
2. විධාන පිළිපැදීම
3. සාධාරණත්වය අගය නොකිරීම
4. ජය පරාජය සතුටින් විද දරා ගැනීම

(19) කලණ මිතුරන් ( යහපත් මිතුරන්) ඇසුරු කිරීම මගින් ඔබට ලැබෙන වාසියක් වන්නේ,
1. ජීවිත සාර් ථකත්වයට හේතුවේ
2. තමන්ට හොඳ නරක පෙන්වා නොදේ
3. හොඳ ගති පැවතුම් පුරුදු නොවේ
4. විභාග අසමත් වේ.

(20) න්‍යෂ්ටික පවුලකට සාපේක්ෂව විස්තෘත පවුලක විශේෂත්වය වන්නේ,
1. සාමාජික සංඛ්‍යාව අඩුවේ.
2. ආර් ථික කටයුතු සඳහා ශ්‍රමය ලබා ගැනීමේ පහසුව
3. බාල පරපුරට සංස්කෘතිය පවරා දීමක් නැත
4. වැඩිහිටියන් සැලකීම ආදර කිරීමට පුරුද්දක් නොමැතිවේ.

## II කොටස

- සියලුම ප්‍රශ්නවලට පිළිතරු සපයන්න.

1)
1. වර් තමාන ජන සමාජයේ පවතින පවුල් ඒකක වර් ග 2 ලියන්න.
2. පවුල තුළ දක්නට ලැබෙන පොදු ලක්ෂණ 2ක් ලියන්න.
3. ජන සමාජයේ පවත්නා හිතකර බලවේග 2ක් ලියන්න.
4. ජන සමාජයේ පවත්නා අහිතකර බලවේග 2ක් ලියන්න.
5. ඔබ සතුටු හා දුක අවස්ථාවක දක්වන ප්‍රතික්‍රියා 2ක් ලියන්න.
6. ආගමික සිද්ධස්ථාන 2ක් නම් කරන්න.
7. පාසලක් තුළින් ඉටුවන සේවාවන් 2ක් ලියන්න.
8. ඔබ ජීවිතයේ සාර්ථක කර ගැනීමට බලාපොරොත්තු වන ආරමුණු 2ක් ලියන්න.

2)
1. වර් තමාන ජන සමාජයේ පවතින පවුල් ඒකක වර් ග 2හි නිර් වචන ලියන්න ල.2
2. ඔබ වඩාත් කැමති කුමන පවුල් ඒකකයක සමාජිකයකු ලෙස ජීවත් වීමටද? එයට හේතුවද සඳහන් කරන්න. ල.4
3. පවුලේ සාමාජිකයෙකු ලෙස ජීවත් වීම නිසා අත්වන ප්‍රයෝජන 4ක් ලියන්න. ල.4

3)
1. පුද්ගලයාගෙන් පුද්ගලයාට සුවිශේෂී වීම පෙන්නුම් කරන ලක්ෂණ 2ක් ලියන්න. ල.2
2. ඔබ පිළිබඳ ආත්මාභිමානයක් ඇතිවන අයුරින් කටයුතු කළ අවස්ථාවක් කෙටියෙන් විස්තර කරන්න. ල.4
3. පවුලේ සාමාජිකයෙකු ලෙස වර් ධනය කරගත යුතු යහපත් ගුණාංග 5ක් ලියන්න ල.5

4)

1. ඔබ නියැලෙන සෞදර්යාත්මක ක්‍රියාකාරකම් 3ක් ලියන්න. ල.3
2. සෞන්දර්යාත්මක ක්‍රියාකාරකම් වල යෙදීම නිසා ඔබට අත්වන ප්‍රයෝජන 3ක් ලියන්න. ල.3
3. ඔබ විවේකය ඵලදායි ගත කරන ආකාර 4ක ලියන්න. ල.4

5)

1. වර් තමාන පවුල් ඒකකය මුහුණපාන අභියෝග 2ක් ලියන්න. ල.2
2. විභාගය සමත්වීම සඳහා ඔබ විසින් අනුගමනය කළ යුතු ක්‍රියාමාර් ග 4ක් ලියන්න ල.4
3. යහපත් පුවැසියකු වශයෙන් ඔබ සතුවිය යුතු ගුණාංග 4ක් ලියා ඉන් කැමති කරුණක් ඔබ ලැබූ අත්දැකීමක් පාදක කරගනිමින් විස්තර කරන්න. ල.5